# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } LCGD/PI/LDO/1/58

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2026.03.17

**චක්‍රලේඛ අංක - 2026/01**

සියළුම පළාත්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස්වරුන්

**රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (e-Slims) මගින් ඉඩම් රාජකාරි කටයුතු සිදු කිරීම**

රජයේ ඉඩම් බැහැර කිරීම හා එසේ බැහැර කරන ලද ඉඩම් වල පසු කටයුතු සිදු කිරීම වඩාත් කාර්යක්ෂම කරලීම සඳහා රජයේ ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය (e-Slims) මගින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර, දීමනාපත්‍ර සකස් කිරීම මෙන්ම රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු අනුමැතිය ලබා දීම, බදුකර සකස් කිරීම, වාර්ෂික අවසර පත්‍ර නිකුත් කිරීම සිදු කිරීමට කටයුතු කරන ලෙස මාගේ චක්‍රලේඛ අංක 2022/01 මගින් ඔබ වෙත උපදෙස් ලබා දී ඇත.

02. එසේම වරින් වර මා විසින් නිකුත් කරන ලද උපදෙස් මගින් කොළඹ, ගම්පහ, කළුතර, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකළපුව, අම්පාර, රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක වල ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම්, දීමනාපත්‍ර නිකුත් කිරීම්, මධ්‍යම පාන්තික ඉඩම් ලබාදීම් සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු නිර්දේශ සහ බදුකර නිකුත් කිරීම්, දෙපාර්තමේන්තු පැවරීම්, පළාත් පාලන ආයතන සඳහා ඉඩම් ලබාදීම්, වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිරීම්, ඉඩම් කච්චේරි පැවැත්වීම් සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරනු ලබන දීමනාපත්‍රවලට අදාළ කොන්දේසි සංශෝධනය, වැරදි නිවැරදි කිරීම් සහ අවලංගු කිරීම් කටයුතු e-Slims පද්ධතිය මගින් සිදුකිරීම අනිවාර්ය කර ඇත.

03. එහෙත් බහුතරයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් e-Slims පද්ධතිය නිසි පරිදි පරීක්ෂා කර ඉහතින් දැක්වූ රාජකාරි කටයුතු නිසි පරිදි ඉටු කරනු ලැබුවද, ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඒ සඳහා ප්‍රමාණවත් උත්සාහයක් නොගන්නා බව නිරීක්ෂණය වී ඇත.

04. එබැවින් මෙ සම්බන්ධයෙන් පැහැදිලි උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන අතර 2026.06.01 දින සිට පහත උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බවට මෙමගින් අවධාරණය කරමි.

05. ඒ අනුව ඉහත සඳහන් කල පරිදි 2026.06.01 දින සිට e-Slims පද්ධතිය මගින් පමණක් සිදු කළ යුතු ඉඩම් කළමනාකරණ කටයුතු පහත පරිදි වේ. එම කටයුතු එදිනෙන් පසු කිසිසේත්ම භෞතිකව සිදු නොකළ යුතු අතර e-Slims පද්ධතිය මගින් පමණක් සිදු කළ යුතු වේ.

- ඉඩම් කච්චේරි ක්‍රියාවලියට අදාළ සියලු කටයුතු
- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබා දීම

- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබා දීම
- හිමිකම නිදහස් දීමනාපත්‍ර ලබා දීම
- විහාරස්ථාන සඳහා පූජාභූමි නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම
- දෙපාර්තමේන්තු සඳහා ඉඩම් බැහැර කිරීම
- පළාත් පාලන ආයතන සඳහා ඉඩම් බැහැර කිරීම
- වාර්ෂික අවසරපත්‍ර ලබා දීම සහ වාර්ෂික අවසර පත්‍ර අලුත් කිරීම
- දීර්ඝකාලීන බදු නිර්දේශ යොමු කිරීම
- හිඟ බදු විස්තර දැනුවත් කිරීම
- මධ්‍යම පන්තික දීමනාපත්‍ර සකස් කිරීම
- දීමනාපත්‍ර කොන්දේසි සංශෝධනය කිරීම

ඉහත සඳහන් අවස්ථා වලදී සිදු කරනු ලබන මුද්‍රණ කාර්යයන් සඳහා ඇමුණුම I හි සඳහන් සම්මත කඩදාසි වර්ගය පමණක්ම භාවිතා කළ යුතු බව මෙයින් දන්වමි.

06. e-Slims පද්ධතිය මඟින් එම කාර්යයන් සිදු කිරීමේදී ක්‍රියාකළ යුතු ආකාරය පද්ධතියේ මුල් පිටුවේ ඇති "උපකාර" අයිකනය තුළට ප්‍රවේශ වීමෙන් පහසුවෙන් පරිශීලනය කිරීමේ හැකියාව ඇත. e-Slims පද්ධතියේ මෙම ක්‍රියාවලීන් සම්බන්ධව ප්‍රමාණවත් පුහුණුවක් බහුතරයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිළධාරීන් වෙත ලබා දී ඇති අතර තවදුරටත් අවශ්‍ය වන පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තුව මඟින් 2026 වර්ෂය තුළ දී ප්‍රමාණවත් පරිදි ලබා දීමට සැලසුම් කර ඇත. එසේම මේ වන විට පළාත් මට්ටමින් පුහුණුකරුවන් සංචිතයක් පවතින අතර අවශ්‍ය පුහුණු වීම් එම නිලධාරීන් සම්බන්ධ කරගනිමින් සිදු කළ හැකිය. එම පුහුණුකරුවන්ගේ නාම ලේඛනය පළාත් මට්ටමින් සකස් කර ඇති WhatsApp සමූහයට යොමු කර ඇති අතර එම පුහුණුකරුවන් සම්බන්ධකර ගැනීමට කටයුතු කරන ලෙසද දන්වා සිටිමි.

07. එසේම ඉහත 05 හි සඳහන් කරන ලද ක්‍රියාවලීන් හැර අනෙකුත් කටයුතු පෙර පරිදිම භෞතිකව මා වෙත යොමු කළ යුතු අතර එම ක්‍රියාවලීන් e-Slims පද්ධතිය මඟින් සිදු කිරීමට අවශ්‍ය පද්ධතියේ සංවර්ධන කටයුතු අවසන් වූ වහාම එම කටයුතු ද පද්ධතිය හරහා සිදුකිරීමට දැනුම්දීම ඉදිරියේදි සිදු කෙරෙනු ඇත.

චන්දන රණවීර ආරච්චි
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. සියලුම දිසාපතිවරුන් -කරු.දැ.ගැ.ස
4. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.
5. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.
6. ඉඩම් කොමසාරිස්, පාලන/බදු/පර්යේෂණ සහ සංවර්ධන/ප්‍රතිපත්ති හා විමර්ශන - කරු.දැ.ගැ.ස

ඇමුණුම I

**මුද්‍රණය කරනු ලබන ලේඛන සඳහා භාවිතා කළ යුතු කඩදාසි වර්ගයන්**

| අනු අංකය | e-Slims පද්ධතිය හරහා සිදු කරනු ලබන කාර්යය | අවශ්‍ය ලේඛන |
|---|---|---|
| 01 | ඉඩම් කච්චේරි ක්‍රියාවලියට අදාළ සියලු කටයුතු | I. ඉඩම් කච්චේරි යෝජනාව සඳහා - A4 සාමාන්‍ය කඩදාසිය<br>II. මූලික තේරීම් ලයිස්තුව සඳහා - A4 සාමාන්‍ය කඩදාසිය<br>III. අවසන් තේරීම් ලයිස්තුව සඳහා - A4 සාමාන්‍ය කඩදාසිය |
| 02 | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබා දීම | I. මුල්පිටපත සඳහා - A3 අයිවරි කඩදාසිය<br>II. කාර්යාල පිටපත සඳහා - A3 සාමාන්‍ය කඩදාසිය (සුදු පැහැති)<br>III. ලෙජරය සඳහා - ලීගල් කඩදාසිය |
| 03 | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබා දීම | I. මුල්පිටපත සඳහා - A3 කොන්කරා කඩදාසිය<br>II. අනුපිටපත් සඳහා - A3 අයිවරි කඩදාසිය |
| 04 | මධ්‍යම පාන්තික දීමනාපත්‍ර ලබා දීම | I. මුල්පිටපත සඳහා - A3 කොන්කරා කඩදාසිය<br>II. අනුපිටපත් සඳහා - A3 අයිවරි කඩදාසිය |
| 05 | හිමිකම නිදහස් දීමනාපත්‍ර ලබා දීම | I. මුල්පිටපත සඳහා - A3 කොන්කරා කඩදාසිය<br>II. අනුපිටපත් සඳහා - A3 අයිවරි කඩදාසිය |
| 06 | විහාරස්ථාන සඳහා පූජාභූමි නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම | I. මුල්පිටපත සඳහා - A3 අයිවරි කඩදාසිය<br>II. කාර්යාල පිටපත සඳහා - A3 සාමාන්‍ය කඩදාසිය (සුදු පැහැති) |
| 07 | දෙපාර්තමේන්තු සඳහා ඉඩම් බැහැර කිරීම | I. මුල්පිටපත සඳහා - A4 අයිවරි කොළය<br>II. කාර්යාල පිටපත සඳහා - A4 අයිවරි කොළය |

| | | |
|---|---|---|
| 08 | පළාත් පාලන ආයතන සඳහා ඉඩම් බැහැර කිරීම | I. මුල්පිටපත සඳහා - A3 අයිවරි කඩදාසිය<br>II. කාර්යාල පිටපත සඳහා - A3 සාමාන්‍ය කඩදාසිය (සුදු පැහැති) |
| 09 | වාර්ෂික අවසරපත්‍ර ලබා දීම | I. මුල්පිටපත සඳහා - ලීගල් කොළය<br>II. කාර්යාල පිටපත සඳහා - ලීගල් කොළය |
| 10 | දීර්ඝකාලීන බදු නිර්දේශ යොමු කිරීම | **භුක්තිය භාරදීමේ ලිපි**<br>I. දීර්ඝකාලීන බදු නේවාසික - කහ පැහැති A4 සාමාන්‍ය කඩදාසිය<br>II. දීර්ඝකාලීන බදු වාණිජ - නිල් පැහැති A4 සාමාන්‍ය කඩදාසිය<br>III. දීර්ඝකාලීන බදු කෘෂිකාර්මික - කොළ පැහැති A4 සාමාන්‍ය කඩදාසිය<br>IV. සමිති සමාගම් - A4 සාමාන්‍ය කඩදාසිය<br>**මුද්‍රණය සඳහා යොමු කරනු ලබන ගැසට් නිවේදනය**<br>I. සිංහල භාෂාව - A4 සාමාන්‍ය කඩදාසිය<br>II. ඉංග්‍රීසි භාෂාව - A4 සාමාන්‍ය කඩදාසිය<br>III. දෙමළ භාෂාව - A4 සාමාන්‍ය කඩදාසිය |
| 11 | හිඟ බදු විස්තර දැනුවත් කිරීම | හිඟ බදු දැනුම් දීම සඳහා - A4 සාමාන්‍ය කඩදාසිය |